## අඟහරුවාදා

<u>පළමුවන කියැවීම</u> **2 මකබ් 6: 18–30**

මකබ්වරුන්ගේ දෙවන පොතෙන් ගත් පාඨයෙකි.

**"අපේ පූජනීය වූ ද, ශුද්ධ වූ ද ව්‍යවස්ථාව උදෙසා, ශුභ මරණයක් ලබා ගැනීමේ උතුම් ආදර්ශයක් මම අපේ තරුණයන්ට තබා යන්නෙමි."**

ව්‍යවස්ථාව පිළිබඳ ප්‍රමුඛ ආචාර්යවරයකු ව සිටියාවූ ද, ඒ වන විටත් බොහෝ වයස්ගත ව සිටියා වූ ද උදාරතර පෙනුමක් ඇතිව සිටි එලියෙසාර් නමැත්තාට ඌරු මස් කවන පිණිස ඔහුගේ කට බලහත්කාරයෙන් අරවන ලදි. එහෙත් ඔහු අපකීර්තියෙන් ජීවත් වීමට වඩා කීර්තිමත් ලෙස මියයාමට අධිෂ්ඨාන කරගෙන සිය කැමැත්තෙන් ම දංගෙඩිය වෙත ගමන් කළේ ය. ඔහු එසේ යද්දී කටේ තිබුණු දේ බිම දැමීය. තමාගේ ජීවිතය රැක ගැනීමට තිබෙන ස්වාභාවික ඇල්ම නිසා පමණක් නොව රස බැලීම පවා නීති විරෝධී වූ දේ තුච්ඡ කිරීම ධෛර්යවන්ත ඕනෑම කෙනෙකුගේ සාමාන්‍ය යුතුකම ය. මේ පාපිෂ්ඨ භෝජන සංග්‍රහය භාර ව සිටි අය ද ඔහු සතු ව තිබුණු ඔවුන්ගේ දීර්ඝ කාලීන මිත්‍රත්වය නිසා, ඔහු විසින් ම පිළියෙල කරන ලද, ඔහුට නීත්‍යානුකූල ව කන්නට අවසර තිබුණු මස් වර්ගයක් ගෙනැවිත් රජුගේ නීතිය පරිදි යාග පූජාවේ මාංශ කන බව බොරුවට අඟවමින් එය කන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියාහ. ඔවුන්ගේ දීර්ඝ මිත්‍රත්වය නිසා ඇතිවුණු කරුණාවෙන් ප්‍රයෝජන ගනිමින් මෙසේ කිරීමෙන් මරණින් බේරෙන්නට ඔහුට ඉඩක් තිබිණි. එහෙත් ඔහු තමාගේ වයසටත් වයසින් ඇතිවන ගරුත්වයටත් කීර්තිමත් පැසුණු හිසටත් ඔබින උදාර තීරණයක් ගනිමින් ළමා වියේ පටන් ඇති වූ නිදොස් චරිතය අනුව යමින්, විශේෂයෙන් ම දෙවියන් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද ශුද්ධ නීතියට එකඟව ක්‍රියා කරමින්, තමාගේ පැහැදීම ප්‍රසිද්ධියේ ම ප්‍රකාශ කරමින්, තමා පාතාළ ලෝකයට යවන ලෙස ඔවුන්ට කීවේ ය. තවද ඔහු කතා කරමින්: "මෙවැනි රැවටිලි කිරීම අපේ ජීවිතයේ මේ අවස්ථාවට තරම් නොවේ. අනූ වියේ සිටි එලියෙසාර් විදේශිකයන්ගේ ජීවිත පිළිවෙළට එකඟ වූයේ යයි යොවුන් වියේ පසුවන බොහෝ දෙනා සිතන්නට පුළුවන. මාගේ ආයු ප්‍රමාණයෙන් ඉතා සුළු කොටසක් නිසා මා මෙසේ ක්‍රියා කළොත් ඔවුන් මා නිසා නොමඟ යන හැකි ය. එවිට මගේ මහළු වයසට මා ගෙන දෙන්නේ කෙලෙසීම සහ අපකීර්තිය පමණෙකි. එහෙත්, මේ මොහොතේ දී නම් මිනිසාගේ අතින් මා ලබන මරනයෙන් මිදෙන්නට පුළුවන. එසේ වුවත් කිසිදාක ජීවතුන් අතර වේවා, මළවුන් අතර වේවා, සර්ව බලැති තැනැත් වහන්සේගේ ග්‍රහණයෙන් මිදෙන්නට මට නුපුළුවන. එබැවින්, මට මේ දැන් ජීවිතයෙන් තුරන් වීමට මිනිස් ශක්තිය ඇති නිසා මගේ මහලු වියට ඔබින කෙනෙකු බව ඔප්පු කරන්නෙමි. එවිට, අපේ පූජනීය වූ ද ශුද්ධ වූ ද ව්‍යවස්ථාව උදෙසා ආශාවෙන් සහ ත්‍යාගශීලිකමෙන් යුතුව සුබ මරණයක් ලබාගන්නේ කෙසේ ද යන්න ගැන උතුම් ආදර්ශයක් මම අපේ තරුණයන්ට තබා යන්නෙමි" යි කීවේ ය.

මේ වචන නිසා ඔහු කෙලින් ම දංගෙඩිය වෙත ගියේ ය. මේ වන තෙක් ඔහුට කාරුණික ලෙස සැලකූ පිරිස මේ ප්‍රකාශනයට පසුව එය අන්ත පිස්සුවක් ලෙස සලකාගෙන ඔහුට විරුද්ධත්වය දැක්වූහ. පහර කා මිය යන්නට පෙර ඔහු හඬ නගා සුසුම්ලමින්, "මට මරණයෙන් ගැලවෙන්නට ඉඩ තිබුණත්, පහර පිට පහර ලැබීම නිසා ඇඟපතේ වේදනා වින්දත්, ස්වාමීන් වහන්සේ මා තුළ හටගන්වන ගරුබිය නිසා ම ඉතා ප්‍රීතියෙන් වේදනා විඳින බව ශුද්ධ වූ දැනුම ඇති උන් වහන්සේ පැහැදිලි ලෙස දකින සේක" යි කී ය.

තරුණයන් උදෙසා පමණක් නොව ජාතියේ බහුතර පක්ෂය උදෙසා ද තමාගේ මරණය උදාරතර ආදර්ශයක් බවට පත් කරවමින්, දැහැමිකමේ වාර්තාවක් පිහිටුවමින්, ඔහු මිය ගියේ එලෙස ය.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 3: 1-7

**පිළිතුර : අපේ රැකවරණය සමිඳාණෝ ය.**

ගීය : සමිඳුනි, මට සතුරෝ ගණනින් බොහෝ වන්නේ ය.
මට විරුද්ධ වන්නෝ එන්න එන්න වැඩි වන්නෝ ය.
"දෙවි පිහිටක් ඔහුට නැතැ" යි මා ගැන කියන්නෝ වැඩි වැඩියෙන් නැගී එන්නෝ ය.

සමිඳුනි, එහෙත් ඔබ මා අවට පලිහක් වැන්න.
මා මහිමය ඔබ ය. ඔබ මා දිරිගන්වන සේක.
මම සමිඳුන්ට හඬ නගා මොර ගසමි. එතුමාණෝ මට පිළිතුරු දෙන සේක.

මම වැදහෙව නිදාගතිමි. යළි අවදි වෙමි.
මන්ද, සමිඳාණෝ මට රැකවරණය දෙන සේක.
දස දහසක් සතුරන් සිටියත් මා වටකොට,
බිය සැක කිසිත් මාගේ සිතට නැත්තේ ය.
සමිඳුනි, වැඩිය මැනව. දෙවිඳුනි, මා මුදාලුව මැනව.

සුපුවත් ජය නද ගීතාවලිය 130: 5

ආලේලූයා! ආලේලූයා!
සමිඳුන්ගේ උපකාරය උදක් ම බලා සිටිමු.
සමිඳු වචනය කෙරෙහි බලාපොරොත්තුව තබමු.
ආලේලූයා!

නොහොත්

සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
"ප්‍රේමය යන්නෙන් අදහස් කරන්නේ, දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම නොව
උන් වහන්සේ අපට ප්‍රේම කර සිය පුත්‍රයාණන් එවීම ය."
ආලේලූයා!

සුවිශේෂය ලූක් 19: 1-10

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"මනුෂ්‍ය පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නාට ද, ගලවාගන්නට ද, වැඩම කළ සේක.**

උන් වහන්සේ ජෙරිකෝවට පිවිස, ඒ මැදින් ගිය සේක. සාකේවුස් නම් ධනවත් ප්‍රධාන අයකැමියෙක් එහි විය. ඔහු ජේසුස් වහන්සේ කවුරුන් දැයි බැලීමට සෙව් ය. එහෙත් ඔහු මිටි කෙනෙකු වූයෙන් සමූහයා නිසා එය කළ නොහැකි විය. ජේසුස් වහන්සේ ඒ පාරෙන් යන්ට සිටි බැවින්, ඔහු පෙරටුව දුව ගොස්, උන්වහන්සේ දක්නා පිණිස අත්තික්කා ගසකට නැංගේ ය. ජේසුස් වහන්සේ ඒ ස්ථානයට පැමිණ උඩ බලා, ඔහුට කතා කොට, "සාකේවුස්, වහාම බිමට බසින්න. අද මට ඔබේ ගෙදර නවාතැන් ගන්ට ඕනෑ ය" යි ඔහුට වදාළ සේක. ඔහු වහා ම බැස අවුත් ප්‍රීතියෙන් උන්වහන්සේ පිළිගත්තේය. ඒ දුටු සියල්ලෝ, "උන්වහන්සේ පව්කාර මනුෂ්‍යයෙකු සමඟ නවාතැන් ගන්නට ගිය සේකැ" යි කියමින් කොඳුලෝ ය. සාකේවුස් නැගිට "ස්වාමිනි, මා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි. යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම්, ඔහුට සතර ගුණයක් ආපසු දෙමි" යි ස්වාමින් වහන්සේට කීය. ජේසුස් වහන්සේ කතා කරමින්, "ගැළවීම අද මේ ගෙදරට පැමිණ ඇත. මොහු ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි. මනුෂ්‍ය පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නට ද ගලවාගන්නට ද වැඩම කළ සේකැ" යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.